# නංගීට ඔවදන්



කතාව සහ සිතුවම්

කායා විතානගේ

# නංගිට ඔවදන්

කතෘ


## ශයිලි කායා විතානගේ

මහාමායා බාලිකා විදුහල

**3** ශ්‍රේණිය C


**කතෘගේ වෙනත් කෘති**

- ගෙදර යුද්ධයක්
- සරුංගල් හීනය
- කුණු කන අලි
- ගොරකා යකා


කෘතිය පළ කරන දිනය – **2026/05/10**

ISBN 978-624-211-237-4

# පිදුම

දවල් වරුවට මගේ නංගීව
ආදරයෙන් පරිස්සමින් බලා
ගන්න
අත්තම්මා,මුත්තම්මා,ආච්චි
සහ අත්තාට මේ පොත
ආදරයෙන් ගෞරවයෙන්
පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.<br>
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.<br>
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ගෙදර ඉන්න චූටි නංගිලා මල්ලිලා දවස තිස්සෙම ගෙදර ඉන්න කොට හරිම දඟයිනේ.

දඟ වැඩ කරාට කාටවත් කරදරයක් හිරිහැරයක් වෙන දේවල් කරන්න හොඳ නෑ.

ඒ වගේම අනතුරුදායක දේවල් කරන්න හොඳ නෑ.

ඉතින් මේ ඔවදන් ඒ පුංචි නංගිලා මල්ලිලාට



හොඳ බබාලා ඇඟිලි කටේ දාන්නේ නෑ.

අතේ ජරාව ගෑවුනොතින් හොඳ බබාලා අත ඉක්මනට සෝදා ගන්නවා.



උඩවල් වල නගිනකොට පුංචි බබාලා බිම වැටෙනවා.

ඒක නිසා හොඳ බබාලා උඩවල් වල නගින්නෙ නෑ.



අම්මා ආසාවෙන් හදන මල් පැල කඩන්න හොඳ නෑ.

එහෙම කරාම අම්මට ගොඩක් දුක හිතෙනවා.



ප්ලග් පොයින්ට් වලට ඇඟිලි ගහන්න යන්න එපා.

ප්ලග් වලට ඇඟිලි දාපුවාම කරන්ට් එක වැදිලා හොස්පිට්ල් ගිහිල්ලා ගොඩාක් දවස් හොස්පිටල් එකේ ඉන්න වෙනවා.



පොඩි පොඩි දේවල් කටේ දාන්න හොඳ නැහැ.

පොඩි පොඩි දේවල් කටේ දාලා ඒවා ගිලුනොත් ඒවා ගන්න හොස්පිට්ල් එකට යන්න වෙනවා.



පුංචි බබාලා තරහා ගන්න හොඳ නැහැ

තරහා ගියාම පුංචි බබාලාගේ මූණ කැත වෙනවා.



පුංචි බබාලා බැල්කනියෙන් එළියට ඔලුව දාන්න හොඳ නෑ.

එතකොට පුංචි බබාලා බිමට වැටිලා ලොකු අනතුරක් වෙන්න පුළුවන්.

මටත් ඉන්නවා දඟුම දඟ නංගියෙක්.
එයාව බලා ගන්න හරි අමාරුයි.

ඉතින් මේ පොතේ චිත්‍ර බලලා කරන අනතුරුදායක වැඩ නවත්තන්න උත්සාහ කරන්න නංගියේ මල්ලියේ.

# කතුවරියගෙන් පණිවිඩයක්



ආදරණීය චූටි නංගිලා සහ මල්ලිලා,

මේ පොතේ කතාව අම්මාටත් තාත්තාටත් කියවාගෙන, එහි ඇති ආදර්ශය තේරුම්ගෙන අවදානම් වැඩ නොකර ඉමු හොඳේ.

මෙය මගේ තුන්වන කතන්දර පොතයි. මෙම කතාව ලිවීමට මට අදහසක් ලැබුණේ මගේ නංගි කරන දඟකාර වැඩ දෙස බලාගෙනයි. ඇයත් හරිම දඟකාරයි!

මෙම පොත ලියන අතරතුර මට මගේ ආදරණීය පන්තිභාර ගුරුතුමියත්, පළමු වසරේ සිට මේ දක්වා මට ඉගැන්වූ සියලුම ගුරුතුමියන්වත් නිතරම මතක් වුණා. මගේ අඩුපාඩු පෙන්වා දී, මා දිරිමත් කළ සියලුම ගුරුතුමියන්ටත්, ලේඛන කලාවට අපව යොමු කරන මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ගරු විදුහල්පතිතුමියටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

ආදරයෙන්,

කායා විතානගේ

**3** වසර - C

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)